# විධායක සාරාංශය

## "අපට සියල්ල සමග යුක්තිය පිළිබඳ අපේක්ෂාවත් නැතිවුණා"

### ශ්‍රී ලංකාවේ ගැටුම් හා සම්බන්ධ ලිංගික හිංසනයට වගඋත්තරදායකවීම පිළිබඳ OHCHR ලුහුඬු වාර්තාව

එක්සත් ජාතීන්ගේ මහා සභාවේ යෝජනා අංක 48/141 සහ මානව හිමිකම් කවුන්සිලයේ අංක 46/1 සහ 51/1 යෝජනාවන්ට අනුකූලව මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්වරයාට හිමි පොදු වරමට යටත්ව නිකුත් කරන මෙම ලුහුඬු වාර්තාව, ශ්‍රී ලංකාවේ ගැටුම හා සම්බන්ධ ලිංගික හිංසනය විසින් ශේෂකළ කල්පවත්නා චිත්තවේගී කම්පනය සහ එහි වින්දිතයන් මත දණ්ඩ මුක්තිය විසින් ඇතිකරන ගැඹුරු බලපෑම පිරික්සා බලයි. වගඋත්තරදායකත්වය පෙරට ගෙනයනු පිණිස අවශ්‍ය කෙරෙන මූර්ත පියවර කවරේදැයි සංක්ෂේප කිරීම සඳහා, බේරීගත් වින්දිතයන් සමග සිදුකළ ප්‍රවිචාරණයන් සහ දශකයකට වඩා දිගු එක්සත් ජාතීන්ගේ විමර්ශන සහ වාර්තා කිරීම් මෙකී ලුහුඬු වාර්තාව ආධාර කොටගනියි.

## ක්‍රමවේදය

මෙම ලුහුඬු වාර්තාව සඳහා, සියලු දිස්ත්‍රික් නියෝජනය කෙරෙන, වින්දිතයන් 27 දෙනකු (ස්ත්‍රීන් 23ක් සහ පිරිමින් 4ක්) සමග සිදුකළ දුරස්ථ ප්‍රවිචාරණය සහ විශ්වසනීය භාහිර මූලාශ්‍රයන් ඒකාබද්ධ කරගත්, වින්දිත කේන්ද්‍රීය සහ සමාජභාවයන් පිළිබඳ සංවේදී ප්‍රවේශයක් යොදාගෙන තිබේ. මෙය පුළුල් සහභාගීත්වයකට මගපාදන ලද අතර, මාර්ගගත ක්‍රමයට සහභාගිකයන් සංවිධානය කරගැනීමේ දුෂ්කරතා, ඍජු නිරීක්ෂණයට ලැබෙන අවම අවස්ථාවන් සහ හුදකලාවේ පිහිටි හා ආන්තික ප්‍රදේශවල සිටි වින්දිතයන්ට විශ්වාසදායක අන්තර්ජාල ප්‍රවේශක පහසුකම් හිඟකම හෝ සංවේදී අත්දැකීම් අථත්‍ය මාධ්‍යයන් ඔස්සේ සාකච්ඡා කිරීමට ඇති පැකිළීම වැනි නිසර්ග සීමාවන් ද එමගින් අභිමුඛ කරනු ලැබුණි.

ගැටුම් සමයේදී හා එයින් පසු ලිංගික හිංසනය, පැතිරුණු, සංස්ථානික සහ ආයතනිකව බලගැන්වූ නිත්‍ය රටාවන් සහිත බවත්, වගඋත්තරදායකත්වය බොහෝ දුරට නොපැවති බවත් මෙම ලුහුඬු වාර්තාව සියළු මූලාශ්‍ර හරහා ඉස්මතු කර පෙන්වයි. තවද, වඩා අදෘෂ්‍යමානව පවතින දෑ මෙම වාර්තාව පෙරබිම්ගත කර පෙන්වනු ලබයි: එනම්, වින්දිතයන්ට දෛනික යථාර්ථයක්ව ඇති දණ්ඩ මුක්තියත්, ඔවුන් විසින් විඳදරා සිටින චිත්තවේගී කම්පනයත්, නිහඬතාවයේ සහ නොපිළිගැනීමේ සමාජ හා මනෝවිද්‍යාත්මක මිලත් යන ඒවා ය.

## සන්දර්භීය පසුබිම

ශ්‍රී ලංකාවේ, ගැටුම් හා සම්බන්ධ ලිංගික හිංසනය වටහාගත යුත්තේ රටෙහි දේශපාලන ප්‍රචණ්ඩත්වය පිළිබඳ පුළුල් ඉතිහාසය තුළ තබා ය. ගැටුම් හා සම්බන්ධ ලිංගික හිංසනය පිළිබඳ ලේඛනගත සිදුවීම් ජනතා විමුක්ති පෙරමුණේ 1971 සහ 1987-89 සන්නද්ධ කැරළි දක්වා දිවෙන අතර රජය සහ දෙමළ ඊළම් විමුක්ති කොටි සංවිධානය අතර වූ සිවිල් යුද්ධය (1983-2009) මුළුල්ලේම එය අවිච්ඡින්නව පැවතියේය. මෙකී කාල වකවානුවලදී, බියගැන්වීමටත්, දණ්ඩනයටත්, ගැටුම් බලපෑ ජනගහණයන් පාලනය කිරීමටත් ලිංගික හිංසනය ඍතුල වශයෙන් යොදාගනු ලැබුණි.

ගැටුමේ නිමාවේ සිට, දණ්ඩ මුක්තියත්, හමුදාකරණයත්, හදිසි නීති සහ අති විශේෂ නීති රාමු සහ බෙලහීන කරන ලද නීතියේ ආධිපත්‍යයත් විසින් තැතිගන්වන සුළු ආකාරයේ දණ්ඩ මුක්තියක් සහ ලිංගික හිංසනය ඇතුළු සමාජභාවය පදනම් කරගත් හිංසාවන් නිර්බාධිතව සිදුවන පශ්චාත් ගැටුම් වාතාවරණයක් පෝෂණය කර තිබේ. ඌන වාර්තාකරණයට, ගැඹුරු අවමානයට සහ ප්‍රතිඵලදායක ප්‍රතිකර්ම රහිතභාවයට දායක වන්නා වූ ආවේක්ෂණ ක්‍රියා, බිය ගැන්වීම් සහ අඛන්තේට්ටම් චිරස්ථායී වූ වටපිටාවක් පිළිබඳව වින්දිතයන් හා ඔවුන්ගේ නියෝජිතයන් විසින් විස්තර කරන ලදී.

## ජාත්‍යන්තර නීතිය තුළ ගැටුම් හා සම්බන්ධ හිංසනය තහනම් කිරීම සහ ශ්‍රී ලාංකීය දේශීය නීති රාමුව

ගැටුම් හා සම්බන්ධ ලිංගික හිංසාවන් තුළ, යුද අපරාධ හෝ මානව වර්ගයාට එරෙහි අපරාධ ගණයේ ලා ගිණිය හැකි, බරපතල ජාත්‍යන්තර නීති උල්ලංඝනය කිරීමක් සංලක්ෂණය වේ. එවැනි උල්ලංඝනයන් වැළැක්වීමටත්, විමර්ශනය කිරීමට සහ අභිචෝදනයටත්, වින්දිතයන්ට හානි පූරණය සහතික කිරීමටත්, බහුවිධ ජාත්‍යන්තර සම්මුති සහ ප්‍රතිඥාවන් ගණනාවක් යටතේ ශ්‍රී ලංකාව බැඳී සිටියි.

කෙසේ වුවද, ගැටුම් හා සම්බන්ධ ලිංගික හිංසාවන් පිළිබඳ කටයුතු කිරීමට අවශ්‍ය නිශ්චිත නීති ව්‍යවස්ථාවන් ශ්‍රී ලංකාව සතුව නැත. පවතින නීති රඳා පවතින පොදු සාපරාධී සහ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන මගින්, පිරිමි සහ LGBTQ+ වින්දිතයන්ටත් බලපාන්නා වූ බලවත් රැකවරණ හිදැස් ශේෂ කරනුයේ, ඔවුන්ගේ අත්දැකීම් නිරන්තරයෙන් නොපිළිගනිමින් හෝ ඒවා නීති විරෝධී අපරාධ බවට පෙරළමිනි. 20 වසරක කාලසීමා ව්‍යවස්ථාවන්ද, දිග්ගැසුණු විමර්ශන ප්‍රමාදයන්ද සහ සීමිත වෝහාරික ධාරිතාවද විසින් යුක්තිය සඳහා වන ප්‍රවේශය තවදුරටත් අවුරා දමයි. ප්‍රතිසංස්කරණ සඳහා නැවත නැවතත් සිදුකෙරී ඇති ඉල්ලීම් තිබියදීත්, අභිචෝදනය විරලව පවතින අතර ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හෝ විධාන වගකීම දරන්නන් වෙතින් කිසිදු වගඋත්තරදායකවීමක් සාක්ෂාත් කරගෙන නොමැත.

## වින්දිතයන්ගේ පර්යාවලෝකයන්

අවස්ථාවාදී, ගණුදෙනුකාරී හෝ සංවිධානාත්මක යනාදී වශයෙන් පුළුල් පරාසයක විහිදුණු ලිංගික හිංසාවන් වින්දිතයන් විසින් විස්තර කරනු ලැබූ අතර ගැටුම් මුළුල්ලේත් හා එහි අවසානයෙන් පසුත්, නිවෙස්වලදීත්, සෝදිසි මුරපොළවල සහ රැඳවුම් මධ්‍යස්ථානවලදීත් ඒවා සිදුකොට තිබේ. ඔවුන්ගේ විස්තර දැක්වීම් කාලය, ස්ථානයන් හා අපරාධකරුවන් සම්බන්ධයෙන් සමානුයෝගී වන අතර මෙකී සිදුවීම් හුදකලා ඒවා නොව, ආධිපත්‍යය සහ පාලනය සඳහා මැනවින් සම්බන්ධීකරණය කරන ලද භාවිතාවන් බව විදහා දක්වයි. අංග ඡේදය, නිරාවරණය කිරීම්, ප්‍රසිද්ධියේ ගර්භා කිරීම් ඇතුළු අපයෝජනයන්ගේ ක්‍රෑරත්වය, කල් පවතින චිත්තවේගී කම්පනයන් ඇති කිරීමේත්, සමස්ත ජන ප්‍රජාවන්ම බිඳ දැමීමේත් චේතනාව මූලික කොටගෙන සිදුකරන බව බොහෝවිට වින්දිතයෝ විස්තර කරති.

උල්ලංඝනයන් පිළිබඳ වාර්තාකිරීමට උත්සාහ දැරීමේ දී වින්දිතයන් බරපතල බාධකවලට මුහුණ දෙයි. පැමිණිලි බොහෝවිට භාරගනු ලබන්නේ රහස්‍යභාවය නොරැකෙන හෝ එදිරිවාදී පසුබිමක වන අතර භාෂා කඩුළු විසින් වාර්තාකරණයේ නිරවද්‍යභාවයත්, නඩු විභාගවල ප්‍රතිඵලත් අනතුරේ හෙළයි; සීමිත වෝහාරික සම්පත් හේතුවෙන් වෛද්‍ය සාක්ෂි නොමැතිකම ඔවුන්ගේ නඩුකර වැඩිදුරටත් බිඳ දමයි. අධිකරණමය සහ පරිපාලනමය අසංවේදීතාත්, අපයෝජනය සිදුකළ නිලධාරීන් විසින්ම පලිගනිතැයි ඇති බියත් විසින් ඉහත කී අභියෝග තවදුරටත් උග්‍ර කර බොහෝ වින්දිතයන්ට යුක්තිය සොයායාම පිළිබඳ අධෛර්යයක් සහ භීතියක් ඇති කරයි.

2018 හානිපූරණ කාර්යාල පනතක් හඳුන්වා දී තිබියදීත්, කිසිදු හානි පූරණයක් නොලැබීම ගැන සියළු ප්‍රවිචාරණයන්හිදී වින්දිතයෝ ප්‍රබලව සැළ කර සිටියහ. ගැඹුරු සමාජ හුදකලාව, දරිද්‍රතාව සහ මනෝවිද්‍යාත්මක හෝ සාමාජීය සහයෝගයක් නොලැබීම පිළිබඳව වැඩිදෙනෙක් විස්තර කළහ. බොහෝදෙනෙක් සිය ප්‍රජාවෙන් පිටමං කරනු ලැබ, තම පවුල්වලින් අත්හැර දමා තිබේ. සියළුදෙනා ඇතුළත් කරගන්නා වූ වින්දිත කේන්ද්‍රීය ප්‍රවේශයන් අනුගමනය කරන්නට නිර්දේශ මගින් ඉල්ලා තිබියදීත්, සංක්‍රාන්ති යුක්ති ක්‍රියාවලීන් තුළ ඔවුන්ගේ සහභාගීත්වය අවම හෝ කොහෙත්ම නොමැති තරම් ය.

තදබල ලිංගික හිංසනයන්ට බඳුන් කරනු ලැබූ පිරිමි වින්දිතයෝ, විශේෂයෙන්ම අවමානයත්, බිය සහ වෙනස් ලෙස සළකන නෛතික රාමුත් හේතුවෙන් අදෘෂ්‍යමානව ජීවත්වෙති. ඔවුන්ගේ දීර්ඝකාලීන කායික සහ මනෝවිද්‍යාත්මක විඳවීම් විශාල වශයෙන් පිළිගැනීමට පාත්‍ර නොවී ශේෂව තිබේ.

## වගඋත්තරදායක වීම පිළිබඳ පර්යාවලෝකයන්: දණ්ඩ මුක්තියේ බලපෑම

OHCHR විසින් සිදුකළ ප්‍රවිචාරණයන්ගෙන් අනාවරණය වූයේ, දශක ගණනාවක් දිග්ගැසුණු සංස්ථාපිත ක්‍රියාදෝෂීබවත්, නොපිළිගැනීම ආයතනගතවීමත් විසින් දණ්ඩ මුක්තිය නොවැළැක්විය හැකි බවට වන පැතිරුණු විශ්වාසයක් හැඩ ගස්වනු ලැබ ඇති බව ය. වින්දිතයෝ, ජාතික සහ ජාත්‍යන්තර අධිකරණමය පද්ධතීන් කෙරෙහි ගැඹුරු විශ්වාසයක් නොමැතිකම අවලව ප්‍රකාශ කළහ. අධිකරණය, බොහෝදෙනා විසින් දක්නා ලද්දේ යුක්තිය කරා වූ මාවතක් වශයෙන් නොව, අපරාධකරුවන් ආරක්ෂා කරන්නා වූ යාන්ත්‍රණයක් වශයෙනි. වසර ගණන් ඇණහිටි හෝ අසමත් නඩු විභාග විසින් වින්දිතයන් භාවමය වශයෙන් විඩාපත් සහ ප්‍රකෝප ගන්වා ඇත්තේ වගඋත්තරදායකත්වය කිසිවිටක ළඟාකරගත නොහැකි දෙයකැයි යන හැඟීම ප්‍රතිබලගන්වමිනි.

වින්දිතයන් විසින් විඳදරාගත් චිත්තවේගී කම්පනය ජීවිත කාලයක් පවතින එකකි. බොහෝදෙනා, නිධන්ගත කායික වේදනාවන් ද, වඳභාවය ද, මානසික බිඳවැටීම් සහ දිවි තොරකර ගැනීමේ සිතිවිලිවලින් ද තවදුරටත් විඳවති. අවමානයන් ඔවුන්ගේ පවුල් දක්වාම දිගුවන අතර දූෂණය හේතුවෙන් උපන් දරුවන්ට නම් පටබැඳ වෙනස්කොට සළකනු ලබයි. ඒ අනුව, දණ්ඩ මුක්තියේ බලපෑම තනි පුද්ගල විඳවීම්වලින් ඔබ්බට ද විහිදේ: නිහඬතාවයෙන්, බියෙන් හා නොවිසඳුණු චිත්තවේගී කම්පනයෙන් ජන ප්‍රජාවන් ඉරිතලා යයි.

එසේ තිබියදීත්, ඇතැම් වින්දිතයන් අවධාරණය කර සිටියේ - තමන්ගේ ප්‍රශ්නයට අදාළ නොවුණද - එම පුළුල් වගඋත්තරදායකත්වය විසින් ගරුත්වය ප්‍රතිස්ථාපනයටත්, නොපිළිගැනීමට එරෙහිව අභියෝග කිරීමටත්, දණ්ඩ මුක්තියේ චක්‍රය බිඳීමටත් උපකාරී වනු ඇති බව ය. තමාට හිමි පුද්ගල යුක්තිය පිළිබඳ බොහොදෙනාගේ අපේක්ෂාවන් භංග වී තිබුණද, වඩා පුළුල් තලයකදී අපරාධකරුවන් වගඋත්තරදායක කිරීමෙන් සමාජමය ආකල්ප වෙනස්කොට, පීඩාවට පත් ප්‍රජාවන්ට පිළිගැනීමක් ප්‍රදානය කළ හැකි බව ය. මනෝවිද්‍යාත්මක සහායත්, ප්‍රජා ප්‍රත්‍යානුකලනයත්, හානිය පිළිබඳ විධිමත්ව පිළිගැනීමත් ඇතුළත් විස්තීර්ණ වූ හානි පූරණයක් ඔවුහු ඉල්ලා සිටිති. යුක්තිය, වින්දිත කේන්ද්‍රීය විය යුතු බවත්, සමාජභාවයන් කෙරෙහි ප්‍රතිචාරාත්මක සහ ප්‍රතිකර්මයක භෞතික හා සංකේතාත්මක යන උභය පාර්ශ්වයන්ම ඇමතිය යුතු බවත් වින්දිතයෝ පවසති.

## නිගමන සහ නිර්දේශ

ශ්‍රී ලංකාවේ ගැටුම් හා සම්බන්ධ ලිංගික හිංසනය, පැතිරුණු, සංස්ථානික සහ නොවිසඳන ලද ආයතනික අසමත්වීම් විසින් බලගැන් වූවකි. එක්සත් ජාතීන්ගේ ව්‍යුහයන් සහ වෙනත් කාරකයන් විසින් යළි යළිත් සිදුකළ නිර්දේශයන් තිබියදීත්, අර්ථාන්විත ප්‍රතිසංස්කරණ තවමත් ක්‍රියාවට නැංවීමට ඉතිරිව තිබෙන අතර වින්දිතයෝ තවදුරටත් නිහඬතාව තුළ විඳදරා ගනිති.

රජයේ සන්නද්ධ හමුදා  සහ අන් අය විසින් කරන ලද ලිංගික හිංසාවන් ප්‍රසිද්ධියේ පිළිගැනීම සඳහා ශ්‍රී ලංකා රජය, ඉක්මන් හා මූර්ත පියවර ගතයුතු අතර විධිමත් සමා අයැදීමක් නිකුත් කිරීමටත්, ආරක්ෂක අංශ, අධිකරණමය සහ නෛතික ව්‍යුහයන් ආවරණය වන පරිදි වින්දිත කේන්ද්‍රීය ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීමටත්, ස්වාධීන අභිචෝදක කාර්යාලයක් ස්ථාපිත කිරීමටත්, මනෝවිද්‍යාත්මක සහ සාමාජීය ආධාරයන්ට ප්‍රවේශක අවස්ථා සහතික කිරීමටත්, එක්සත් ජාතීන්ගේ සංවිධානය පූර්වයෙන් කළ යෝජනාවන් යටතේ සිදුකළ ප්‍රතිඥා ක්‍රියාත්මක කිරීමටත් කටයතු කළ යුතු ය. මෙකී චිරකාලීන නිර්දේශයන් භාවිතයන් බවට පරිවර්තනය කරමින් රජයේ ජාත්‍යන්තර බැඳීම් සතෘප්ත කිරීම සම්බන්ධයෙන් සුනිශ්චිත ප්‍රගතියක් පෙන්නුම් කිරීමට අවංක දේශපාලන අධිෂ්ඨානයක් අවශ්‍ය වේ.

ජාතික අධිකාරයන් ක්‍රියාත්මක වීමට අසමත් වන තැනදී, යෝග්‍යතාව අනුව, සර්වභෞමික සහ බහිර්භෞමික අධිකරණ බලය අභ්‍යාස කිරීම මගින් වගඋත්තරදායකත්වයට අදාළ ප්‍රයත්නයන්ට ජාත්‍යන්තර ප්‍රජාව සහාය දැක්විය යුතු අතර, ජාත්‍යන්තර නීතිය හා සමානුයෝගීව අපරාධකරුවන්ට එරෙහිව ඉලක්කගත සම්බාධක පැනවීමටත්, සාම සාධනය සහ ද්වි පාර්ශ්වික සහයෝගීතාවන් සඳහා සළකා බලන පුද්ගලයන් දැඩි සුපරීක්ෂාවට භාජනය කිරීමට සහ වින්දිතයන්ට සහ සිවිල් සමාජ සංවිධානවලට තිරසාර සහාය සහතික කිරීමටත් ක්‍රියාකළ යුතු ය.

ගැටුම් හා සම්බන්ධ ලිංගික හිංසනයන් පිළිබඳව කටයුතු කිරීම නෛතික බැඳීමක් සහ සදාචාරාත්මක අනිවාර්යයකි. පිළිගැනීම, සත්‍යය, වගඋත්තරදායකවීම සහ හානි පූරණය වින්දිතයන්ගේ ගරුත්වය ප්‍රතිස්ථාපනය කිරීමටත්, ශ්‍රී ලංකාවේ තිරසාර සාමය ගොඩනැංවීමටත් අත්‍යවශ්‍ය වේ.